**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය වූ තවමත් භාවිතයේ පවතින පිරිවැය රු.24,730,308 ක් වූ වත්කම්වලින් පිරිවැය රු.11,176,630 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | විගණනයේ සඳහන් මිලියන 11 වටිනාකමකින් යුතු වත්කම් මෙහෙයුම් ආදායම් සඳහා යොදා නොගන්නා බැවින් ප්‍රත්‍යාගණනය සඳහ යොදා නොගත් බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පිරිවැය රු.3,096,741 ක පිරියත හා උපකරණ රු.965,000 කට ප්‍රත්‍යාගණනය කොට තිබූ අතර මෙම ප්‍රත්‍යාගණන වත්කම්වලට අදාලව සියයට 20 බැගින් වර්ෂයට අදාල රු.193,000 වූ ක්ෂය, ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ පිරියත අගය මත අදාළ වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ගිණුම් අංශයේ අතපසුවීමකින් ගණනය නොවී ඇති බව අනාවරණය වූ බැවින් එය 2023 වර්ෂයේ දි ජ'නල් අංක 687 යටතේ අදාළ ක්ෂය ප්‍රමාණය ගිණුම්වලින් මහ හැරිම පෙර වර්ෂ සටහනක් ලෙස නිවැරදි කර ඇති බව. | ක්ෂය වීම් නිවැරදිව ගණනය කර ගිණුම් ගත කල යුතුය. |
| (ආ) | පිරිවැය රු.13,553,678 ක් වූ වත්කම් රු.9,077,000 කට ප්‍රත්‍යාගණනය කිරීමෙන් විගණනයට අනුව ප්‍රත්‍යාගණන ලාභය රු.9,039,528 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් | ඉහත සඳහන් ක්ෂය ගණනය කිරීමෙන් ප්‍රත්‍යාගණන ලාභය වැඩියෙන් නිරූපණය වි ඇති අතර අදාළ ඉහත නිවැරදි කිරිම නිසා ප්‍රත්‍යාගණන ලාභය නිවැරදි | නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන ලාභය ලෙස රු.9,476,327 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ප්‍රත්‍යාගණන ලාභය රු.436,800 ක් වැඩියෙන් දැක්වුණි. | වි ඇති බව | |
| (ඇ) | වත්කම් ප්‍රත්‍යාගණන උපලේඛණයට අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පිරිවැය රු.14,058,605 ක වත්කම් 2022 දෙසැම්බර් 31 දිනට රු.9,077,000 කට ප්‍රත්‍යාගණනය කළ බව දක්වා තිබුණත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වත්කම්වල පිරිවැය රු.13,553,679 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව උපලේඛණය හා මූල්‍ය ප්‍රකාශන අතර රු.504,926 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණන නිරික්ෂණය සම්බන්ධයෙන් කරුණු සොය බැලීමේ දි මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් අගය නිවැරදි වන බවට ගිණුම් අංශය තහවුරු කර අතර ප්‍රත්‍යාගණන ලේඛනය නිවැරදි කර ගැනිමට ඔවුන් කටයුතු කර ඇති බව දන්වා සිටිමි | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතුලත් කල යුතුය. |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමෙහි ස්කන්ධය සහ රඳවාගත් ඉපයීම් වල ආරම්භක ශේෂයේ එකතුව රු. 233,597,501 ලෙස සඳහන් වුවද, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි එය රු.235,156,680 ක් ලෙස දක්වා තිබූයෙන් රු.1,559,179 ක වෙනසක් නිරීක්ෂණය විය. | ආයතනය විසින් ගිණුම් පිළියෙළ කිරිමේ දි එය Excel පත්‍රිකාවක් යොදා ගත් අතර එහිදි ගිණුම් ඉදිරිපත් කිරිමේ දි ගිණුම් පරිශීලකයන්ට වඩාත් පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයට ගිණුම් ඉදිරිපත් කර බවට කරුණු පැහැදිලි කරන ලදි. | නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත | | | | |
| | | i. | 20 (1) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පනතේ විධිවිධාන යටතේ ආයතනයේ කර්තව්‍ය කිසිවක් හෝ ඒ සියල්ල කරගෙනයාමේ කාර්යය සඳහා සහ පනතේ මූලධර්මවලට බලාත්මකභාවයක් | අමාත්‍ය නියෝග සැදිම සඳහා මෙම පනතේ වෙනස්කම් සිදු කළ යුතු හෙයින් මේ වන විට ආයතනය විසින් කම්කරු අමාත්‍යාංශය මගින් නව සංශෝධන සහිතව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ගරු නීතිපති වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාදීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි වුවත් එම නියෝග සාදා නොතිබුණි. | | |
| | ii. 11 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍ය වියයුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරු වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාව විසින් පත්කරනු ලැබිය යුතු වුවත් එසේ පත්කර නොතිබුණි. | අදාළ විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉදිරියෙදි පැවැත්විමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දි අවධානය යොමු කර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශ ලබා ගැනිමට කටයුතු කිරිමට සටහන් කර ගතිමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 10.2 ඡේදය සහ මාර්ගෝපදේශ අංක 14 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අදාල චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආයතනයෙන් කරුණු විමසිමේ දි 2020 වර්ෂයේ සිට ම කාර්ය සාධන 2022 වර්ෂයේ ඉදිරිපත් කරන ලද ක්‍රමවේදය (Format) අනුගමනය කර ඇති අතර ඒ සම්බන්ධව අදාළ චක්‍රලේක අංකය හෝ උපදෙස් ලබා දි ඉදිරි වර්ෂයේ නිවැරදි කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරිමට කටයුතු කිරිමට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කාර්යයසාධන වාර්තාව පිළියෙල කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.48,116,618 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,122,253 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,994,365 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම් සහ ස්ථාවර තැන්පතු පොළී ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයෙහි අනුමත කාර්යය මණ්ඩලය 25 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 16 ක් විය. ආයතනයේ කාර්යය හා කර්තව්‍ය මෙහෙයවීමේදී අණපණත් මගින් පැවරෙන කාර්යයන් සඳහන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරාදෙන කළමණාකරණ කාර්යයන් ඉටුකිරීමේ කාර්යයෙහි නිරතවන ප්‍රධාන විධායක නිලධාරී තනතුර වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගන්නා බව නිරීක්ෂණය විය. ආයතනයේ පැවැත්ම උදෙසා වැදගත් කාර්යයභාරයක් පැවරෙන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ස්වස්ථතා) තනතුර සඳහාද ස්ථිර නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය වුවද, අවශ්‍ය අවස්ථාවන්හිදී සම්පත්දායකයෙකුගේ සේවය ලබාගනිමින් පැවතුණි. | විගණනයේ සඳහන් පුරප්පාඩු අතරින් අධ්‍යක්ෂකවරයෙකු හා සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනිමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා කටයුතු සුදානම් කර ඇති බව සඳහන් කරමි.<br><br>එමෙන්ම විගණනයේ සඳහන් අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ස්වස්ථා) තනතුර සඳහා ද කොන්ත්‍රාත් පදනම යටතේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර මෙන් සේවාවක් ලබා නොගන්නා බව තහවුරු කරමි. | ආයතනයේ කාර්යභාර්යය ඉටුකර ගත හැකි වන පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |